*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,242 - 2021 අගෝස්තු මස 20 වැනි සිකුරාදා - 2021.08.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1762 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1768 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1770 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1771 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1772 |


*සැ. යු.* -(i) ආගමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත, 2021 ජූලි මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2021 ජූලි මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 සැප්තැම්බර් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙමගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්ගමුව

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද වැලි සහ බොරළු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පාන්නන් ඉදිරිපත් නොවූ පහත උපලේඛනයේ දැක්වෙන නඩු භාණ්ඩ **2021.09.06 සඳුද දින පෙරවරු 9.30 ට** අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන භාණ්ඩ පිළිබඳ අයිතිවාසිකම් කියන්නකු සිටී නම්, වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.30 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

03. වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, පස්වරු 4.00 ට පෙර අදාළ භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් පමණක් සිදුකළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසියේ කටයුතු අවසන් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ.

රසික මල්ලවආරච්චි,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගල්ගමුව.

2021 අගෝස්තු මස 03 වැනි දින,
ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

වැලි :

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 1. | 30409 | වැලි කියුබ් 3/4 |
| 2. | 30408 | වැලි කියුබ් 3/4 |
| 3. | 30444 | වැලි කියුබ් 03 |
| 4. | 30615 | වැලි කියුබ් 01 |
| 5. | 30736 | වැලි කියුබ් 3/4 |
| 6. | 30798 | වැලි කියුබ් 1/2 |
| 7. | 30833 | වැලි කියුබ් 3/4 |
| 8. | 30907 | වැලි කියුබ් 3/4 |
| 9. | 31184 | වැලි කියුබ් 03 |
| 10. | 31216 | වැලි කියුබ් 1/4 |
| 11. | 31761 | වැලි කියුබ් 3/4 |
| 12. | 32155 | වැලි කියුබ් 3/4 |
| 13. | 32264 | වැලි කියුබ් 01 |
| 14. | 32574 | වැලි කියුබ් 01 |

බොරළු :

| | | |
|---|---|---|
| 1. | 30302 | බොරළු කියුබ් 3/4 |
| 2. | 30554 | බොරළු කියුබ් 01 |
| 3. | 30616 | බොරළු කියුබ් 01 |
| 4. | 30670 | බොරළු කියුබ් 03 |
| 5. | 30744 | බොරළු කියුබ් 03 |
| 6. | 30848 | බොරළු කියුබ් 3/4 |
| 7. | 30970 | බොරළු කියුබ් 01 |
| 8. | 30969 | බොරළු කියුබ් 01 |
| 9. | 31202 | බොරළු කියුබ් 01 |
| 10. | 31314 | බොරළු කියුබ් 3/4 |
| 11. | 32265 | බොරළු කියුබ් 03 |
| 12. | 32263 | බොරළු කියුබ් 03 |
| 13. | 32618 | බොරළු කියුබ් 01 |

08-289

---

## ශ්‍රී ලංකා පොලිසිය - මීගමුව කොට්ඨාසය

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

මීගමුව පොලිස් කොට්ඨාසයට අයත් පාවිච්චි කර ගර්හිත කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම **2021 සැප්තැම්බර් මස 08 වන දින පැය 1000 ට** මීගමුව පොලිස් අධිකාරී පරිශ්‍රයේ දී පැවැත්වේ.

2021.09.07 වන දින පැය 1400 සිට 1600 දක්වා අදාල භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි භූමියට ඇතුල් වන සියළුම තාරතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා ලදුපත් ලබා ගත යුතුයි. වෙනත් ගෙවීමේ ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ 2021 සැප්තැම්බර් මස 08 දින පැය 1600 ට පෙර අදාල පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර ගන්නා උපාංග පිළිබඳ වගකියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සඳහා විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

සමන් සිගේරා,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
මීගමුව - කොට්ඨාසය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *භාණ්ඩයේ නම* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | පොරෝ තළ | 01 |
| 2. | බොයිලර් | 01 |
| 3. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | 01 |
| 4. | සී. පී. යූ. | 04 |
| 5. | බෝතල් විවෘත කරන උපකරණ | 02 |
| 6. | මොනිටර් | 02 |
| 7. | කුෂන් පුටු | 11 |
| 8. | පරිගණක පුටු | 06 |
| 9. | සණක යන්ත්‍ර | 10 |
| 10. | යකඩ පුටු | 22 |
| 11. | වානේ කබඩ් | 08 |
| 12. | කෑම මේස පුටු | 03 |
| 13. | මන්න පිහි | 03 |
| 14. | වතුර මෝටර් | 02 |
| 15. | පාපැදි | 11 |
| 16. | කුෂන් පුටු | 09 |
| 17. | ටියුබ් ලයිට් පිටින්ස් | 44 |
| 18. | ගෑස් කුකර් | 01 |
| 19. | විධායක පුටු | 01 |
| 20. | ගිණි නිවන උපකරණ | 02 |
| 21. | ෆැක්ස් යන්ත්‍ර | 16 |
| 22. | මේස විදුලි පංකා | 02 |
| 23. | වතුර ෆිල්ටර් | 04 |
| 24. | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 25. | තාච්චි | 01 |
| 26. | සාස්පාන් | 20 |
| 27. | විදුලි ස්ත්‍රික්ක | 02 |
| 28. | රූපවාහිනී | 09 |
| 29. | සිංහල යතුරුලියන | 21 |
| 30. | ප්ලාස්ටික් පුටු | 129 |
| 31. | කාර්යාල පුටු | 04 |
| 32. | වානේ කබඩ් | 02 |
| 33. | ප්‍රථමාධාර ඇඳන් | 01 |
| 34. | ෆොටෝකොපි මැෂින් | 01 |
| 35. | මොනිටර් | 04 |
| 36. | ප්ලාස්ටික් ට්‍රේ | 03 |
| 37. | විදුලි කේතල් | 03 |
| 38. | පැඩ්ලොක් | 13 |
| 39. | ප්‍රින්ටර් | 05 |
| 40. | පන්චර් | 07 |
| 41. | පවර් කෝඩ් | 04 |
| 42. | රෝනියෝ මැෂින් | 01 |
| 43. | රෝඩියෝ | 01 |
| 44. | කප්බෝඩ් ස්ටීල් | 05 |
| 45. | කතුරු | 03 |
| 46. | රූපවාහිනි | 02 |
| 47. | සිටවන විදුලි පංකා | 11 |
| 48. | ස්ටේපර් මැෂින් | 03 |
| 49. | කතුරු | 03 |
| 50. | ඉංග්‍රීසි යතුරුලියන | 01 |
| 51. | පැට්‍රෝල්මැක්ස් | 05 |
| 52. | සිවිලින් විදුලි පංකා | 45 |
| 53. | කාර්යාල මේස | 02 |
| 54. | මේස හැඳි | 08 |
| 55. | වාහන පරීක්ෂා කිරීමේ කන්නාඩි | 05 |
| 56. | පිහි | 01 |
| 57. | බිත්ති ඔරලෝසු | 03 |

08-267

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල**

කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවලට අදලව රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ හා හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ වර්ෂ **2021 ක් වූ සැප්තැම්බර් මස 11 වැනි දින පෙ. ව. 10.00** ට කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියෙහි විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් භාණ්ඩ සඳහා හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුයි.

අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.15 - පෙ. ව. 9.45 තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

අධිකරණය මගින් ඉදිරිපත් කරන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එදිනම ප. ව. 4.00 ට පෙර මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන පුද්ගලයින් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

වාසනා නවරත්න,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කෑගල්ල.

2021 අගෝස්තු මස 04 වැනි දින,
කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | |
|---|---|---|---|
| 01. | 38421/16 | සීෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටර් එකයි | අබලි ලෙස |
| 02. | 2716/16 | සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටර් එකයි | අබලි ලෙස |
| 03. | 34884/20 | 1. ලිට්රෝ වර්ගයේ ටී 12.8 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. කරාමය රහිත වට 04 ගෑස් ලිප් දෙකයි | |
| 04. | 37502/20 | 1. ලිට්රෝ වර්ගයේ ටී 4.4 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකයි | |
| 05. | 34588/21 | 1. ලිට්රෝ වර්ගයේ ටී 12.08 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය සහිත වට 03 යුතු ගෑස් ලිප් එකයි | |
| 06. | 31945/20 | 1. ලාෆ් වර්ගයේ ටී 7.09 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය සහිත වට 03 ගෑස් ලිප් එකයි | |
| 07. | 33951/20 | 1. ලිට්රෝ වර්ගයේ ටී 12.05 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය සහිත වට 03 යුතු ගෑස් ලිප් එකයි | |
| 08. | 29022/19 | 1. ලිට්රෝ වර්ගයේ ටී 12.5 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය හිත වට 04 යුතු ගෑස් ලිප් එකයි | |
| 09. | 27500/19 | 1. ලිට්රෝ වර්ගයේ ටී. 12.5 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය සහිත වට 02 යුතු ගෑස් ලිප් එකයි | |
| 10. | 27005/19 | 1. රෙගියුලේටරය රහිත වට 03 යුතු ගෑස් ලිප් එකයි<br>රෝස පැහැති ප්ලාස්ටික් බේසම් එකයි | |
| 11. | 21044/18 | 1. ලිට්රෝ වර්ගයේ ටී. 12.4 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය සහිත වට 04 යුතු ගෑස් ලිප් එකයි | |
| 12. | 33462/20 | 1. වට 04 යුතු රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකයි | |
| 13. | 3902/21 | 1. ලිට්රෝ වර්ගයේ ටී 12.5 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි<br>2. වට 03 යුතු රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකයි | |
| 14. | 2554/16 | 1. ලිට්රෝ වර්ගයේ ටී 8.5 ගෑස් සිලින්ඩර් එකයි<br>2. රෙගියුලේටරය රහිත වට 04 ගෑස් ලිප් එකයි | |
| 15. | 10764/17 | 1. ලිට්රෝ ටී 12.5 ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් එකයි | |
| 16. | 10638/17 | රෙගියුලේටරය සහිත වට 03 ගෑස් ලිප් එකයි | |
| 17. | 34092/20<br>බී/8154/20 | 1. පවර් මැක්ස් වර්ගයේ වතුරේ ගිල්වන වතුර මෝටර් එකයි<br>2. LACELA වර්ගයේ රොටරි හැමර් එකයි<br>3. හැමර් කටු 06 සහිත පෙට්ටි 01<br>4. නිල් පැහැති ජැක් එකයි<br>5. තැඹිලි පැහැති චේන් බොලොක්ක 01<br>6. මකිටා වර්ගයේ ග්‍රයින්ඩර් එකයි<br>7. අඩි 30 දිග කැන්වස් හෝස් එකයි<br>8. අඩි 30 දිග, අඟල් 02 ප්ලාස්ටික් වතුර බට එකයි<br>9. ප්ලග් ටොප් 02ක් සහිත අඩි 32 දිග වයර් එකයි<br>10. නිල් හා අලු පැහැති ටෙන්ඩ් රෙදි එකයි | |
| 18. | 2986/21<br>(බී/693/20) | 1. අඩි 60 අඟල් 02ක් දිග තංගුස් ලණුව<br>2. අඩි 38 අඟල් 10 දිග ඇම්පියර් 05 ප්ලග් ටොප් 03 සහිත වයරය<br>3. කලු හෝල්ඩරය සහිත අඩි 08 අඟල් 03 දිග වයර් 02<br>4. ප්ලාස්ටික් බාල්දිය<br>5. පිත්තල සීනුව<br>6. මැටි පාත්තරය. | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 19. | 36468/20 | හිසෙහි රඳවන කළු පාට විදුලි පන්දම් එකයි |
| 20. | 36026/20 | පිරිමි අත් ඔරලෝසු එකයි |
| 21. | 34976/20 (බී/8518/20) | කළු පාට නොකියා වර්ගයේ ජංගම දුරකථන එකයි |
| 22. | 29039/19 (බී/5434/19) | නොකියා වර්ගයේ ජංගම දුරකථන එකයි |
| 23. | ඒආර්/322/19 | සැම්සුන්ග් වර්ගයේ ජංගම දුරකථන එකයි |
| 24. | ඒආර්/8917/20 | හුවාවි වර්ගයේ ජංගම දුරකථන එකිය |
| 25. | ඒආර්/8915/20 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන එකයි |

08-333

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක වී ඇති භාණ්ඩ/උපකරණ/වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු අවසන් වී ඇති රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ/උපකරණ/වැලි **2021.09.04 වැනි දින පෙ. ව. 10.00 ට** බිබිල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙකී ලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන අයෙකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථමව තම හිමිකම අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 9.45 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂා කිරීමට ඉඩ දෙනු ලැබේ. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව, නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවලේ ම මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් එදින ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර වැලි සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් පසු ඉවත් කර ගැනීම සඳහා දින 02ක කාලයක් ඉක්මවීමට පෙර කාර්යාල වේලාව තුළ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, වෙන්දේසිය සම්බන්ධව පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවතින අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලුම් කිරීමට පැමිණෙන්නන් අනන්‍යතාවය තහවුරු කිරීමට තම ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කළ යුතු අතර රටේ පවතින කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආරක්ෂිත සෞඛ්‍ය උපදෙස් පිළිපැදීමත්, ඒ අනුව අධිකරණ භූමියට පැමිණ සහභාගි වීමටත් මිලදී ගැනීමට අපේක්ෂිත පුද්ගලයා පමණක් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

චතුර ප්‍රසන්න අමරතුංග,
මහෙස්ත්‍රාත්,
බිබිල.

2021 අගෝස්තු මස 06 වැනි දින,
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ 2021.09.04**

ප්‍රසිද්ධ වෙන්දේසි ලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | AR/488/20 | පාපැදි 01යි |
| 02. | 42417 | පාපැදි 01යි |
| 03. | 42221 | පාපැදි 01යි |
| 04. | 41088 | පාපැදි 01යි |
| 05. | AR/340/13 | පාපැදි 01යි |
| 06. | 29526 | අත් ට්‍රැක්ටර් මැෂිමට සවිකිරීමට යොදගන්නා ලද අමතර රෝදය සහිත කොටස |
| 07. | 47523 | ජලයේ ගිල්වා ක්‍රියා කරන ලද වතුර මෝටරය |
| 08. | 46310 | අංක 1101501223 දරන ජලයේ ගිල්වා ක්‍රියා කරන ලද වතුර මෝටරය සිංගර් වර්ගයේ 1 HP |
| 09. | 47523 | හැමර් ඩ්‍රිල් මැෂින් 01යි Dongcheng වර්ගයේ |
| 10. | 48930 | 12.05 kg නිල් පාට LITRO වර්ගයේ ගෑස් ටැංකි 01යි |
| 11. | 48930 | රෙගුයිලේටරය සමග බට 04 ගෑස් ලිප් 01යි |
| 12. | 32181 | සාදා නිම කරන ලද බුරුත වර්ගයේ ලොකු පුටු 01 පොඩි පුටු 02 ස්ටූල් 01 |
| 13. | 47921 | සාදා නිම කරන ලද ඇඳ විට්ටම් 02යි |
| 14. | 47920 | ටවල් රැක් 01 |
| 15. | 47523 | අඩි 11ක් දිග ප්ලාස්ටික් බට 04යි අඩි 35ක් දිග කළු පාට හෝස් බට 02යි. පුටුවැල් 01යි |
| 16. | 46310 | අඩි 57 අඟල් 04 දිග 1' වට ප්‍රමාණයේ පොලිඑතලීන් බට 01යි |
| 17. | 42041 | තඹ කම්බි 13Kg 300g ප්‍රමාණයක් |
| 18. | 47473 | කෘෂි කාර්මික කටයුතු සඳහා යොදා ගන්නා ලද කුළු ගෙඩි 01යි |
| 19. | 48421 | තරාදි 01 |

20. ඇළුමිනියම් ලොකු මුට්ටි - 07යි
44997
44865
45127
44410
44912
44592
AR/316/21
ඇළුමිනියම් පොඩි මුට්ටි 04යි
45167
44592
42179
46224

අනු. අංකය / නඩු අංකය / භාණ්ඩ පිළිබඳ විස්තරය

21. 48930 කාඳු සහිත ඇළුමිනියම් කල්දේරම් 01යි
22. ඇළුමිනියම් කලගෙඩි 10යි
44281
44990
47997
45047
44997
44619
44610
44859
44594
44746
23. පතුල සිදුරු කරන ලද ඇළුමිනියම් ලොකු බාල්දි 01යි
44711
පතුල සිදුරු කරන ලද ඇළුමිනියම් පොඩි බාල්දි 07යි
47217
47252
47490
48026
48020
47779
47606
47606
47411
47523 පතුල සිදුරු නොමැති ඇළුමිනියම් කුඩා බාල්දි 03යි
24. කෘෂි කාර්මික කටයුතු සඳහා යොද ගන්නා ලද සවල් 05යි
47427
47427
47711
48026
47815
25. කෘෂි කාර්මික කටයුතු සඳහා යෙද ගන්නා ලද උදළු 10යි
45244
47513
47749
AR/50/21
47447
47473
47379
47329
47329
47331
26. කැණිම් කිරීම සඳහා යොද ගන්නා ලද ලොකු ගැරුම් වට්ටි 07යි
44531
47749
46724
47379
AR/50/21
47606
47606

අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය

කැණීම් කිරීම සඳහා යොදා ගන්නා ලද පොඩි වේවැල් කුඩ 06යි
47120
47118
47379
46775
AR/50/21
AR/50/21

27. 47977 ප්ලාස්ටික් ලොකු බේසම් 01යි
28. 46424 සුදු පාට ප්ලාස්ටික් බකට් 01යි
29. 45912 ලා නිල් පාට කුඩා ප්ලාස්ටික් බකට් 01යි
30. 47997 නිල් පාට කුඩා ප්ලාස්ටික් බකට් 01යි
31. 44575 රෝස පාට කුඩා ප්ලාස්ටික් බකට් 01යි
32. 44636 ප්ලාස්ටික් කුඩා කිරිගොටු 01යි, කෝප්ප 01යි
33. 45912 ප්ලාස්ටික් කුඩා කෝප්ප 06
34. 47523 අඩි 39 දිග තංගුස් ලණු 01යි
අඩි 47 දිග තංගුස් ලණු 01යි
35. 47473 විවිධ ප්‍රමාණයේ දිග තනිපට වයර් රෝල් 01යි
36. 47523 අඩි 33ක් දිග දෙපට වයර් රෝල් 01යි
37. 46310 පලග් ටොප් එකක් සවිකරන ලද අඩි 173 අඟල් 08 දිග දෙපට වයර් රෝල් 01යි
38. 47523 යකඩ බොලොක්ක 01යි, පෝසිලේන් බොලොක්ක 01
39. 44594 කුඩා ප්‍රමාණයේ ඇලුමිනියම් කොරොස් 01
40. 47523 ප්ලාස්ටික් තාච්චි 02යි
41. 42128 ප්ලාස්ටික් තාච්චි 01යි
42. 46094 යකඩ තාච්චි 01යි
43. 47238 සින්තා වර්ගයේ පැදුරු 01යි
44. 47237 සින්තා වර්ගයේ පැදුරු 01යි
45. 47291 සින්තා වර්ගයේ පැදුරු 01යි
46. 47375 පන් පැදුරු 01යි
47. තහඩු ලොකු බැරල් 11යි
44986
AR/352/20
AR/454/20
44985
44768
45637
44815
44621
44540
AR/767/20
AR/309/20
40701 තහඩු කුඩා බැරල් 01යි

අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය

48. අංක රහිත විවිධ ප්‍රමාණයේ /තංගුස් ලණු කැරලි 01යි
රෙදි ලණු කැරලි 01යි
කොහු ලණු කැරලි 01 යි
රෙදි ලණු කැරලි 01යි
49. අංක රහිත විවිධ ප්‍රමාණයේ දිග තනි පට වයර් රෝල් 01යි
50. අංක රහිත ඇලුමිනියම් ලොකු තාච්චි 01යි
පොඩි තාච්චි 03යි
කුඩා නැබිලි 01යි
කුඩා අඩිවලං 01යි
51. අංක රහිත නැවත ආරෝපනය කළ හැකි ප්ලාස්ටික් විදුලි පන්දම 04යි
ඇලුමිනියම් විදුලි පන්දම් 01යි
52. නීති විරෝධී මත්පැන් විනාශ කිරීමෙන් පසු හිස් වීදුරු බෝතල්
මි. ලී. 750 හතරැස් හිස් බෝතල් 1099
මි. ලී. 750 රවුම් හැඩති හිස් බෝතල් 704
මි. ලී. 625 හිස් බියර් බෝතල් 125
මි. ලී. 375 හිස් බෝතල් 24
මි. ලී. 180 හිස් බෝතල් 132
53. නීති විරෝධී මත්පැන් විනාශ කිරීමෙන් පසු හිස් වූ කෑන්/බූලි
ලීටර් 5 ප්‍රමාණයේ හිස් කෑන් 104
විවිධ ප්‍රමාණයේ පොඩි කෑන් 64
ලීටර් 20 ප්‍රමාණයේ හිස් කෑන් 41
ප්ලාස්ටික් කල ගෙඩි 30

54. රාජසන්තක කරන ලද වැලි කියුබ් 16
47334
47549
47849
48162
48026
48171
48511
48855
48941
48976
49004
48998
48991
49026
49085

ආහාර ද්‍රව්‍ය :

55. 47848 සහල් 25 kg ඇසුරුම් 08යි (සත්ව ආහාර සඳහා පමණි).

08-435

මගේ අංකය : හෙට්ටි/මහෙ/අධි/නඩු භාණ්ඩ/වෙන්දේසි.

**හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණය**

2021.08.13 හා 2021.08.21 දිනට පැවැත්වීමට තිබූ ප්‍රාදේශීය වෙන්දේසිය හා ප්‍රසිද්ධ වෙන්දේසිය අවලංගු කිරීම

උක්ත කරුණට අදළව 2021.07.30 දිනැති ගැසට් පත්‍රයේ 07-681 හා 07-682 යටතේ වූ භාණ්ඩ වෙන්දේසි රටේ පවතින කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නොපැවැත්වෙන බවට මෙයින් දැනුම් දෙමි.

එච්. පී. එස්. දුලන්ගිකා ජයසිංහ,
මහෙස්ත්‍රාත්,
හෙට්ටිපොල.

2021 අගෝස්තු මස 11 වැනි දින,
හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

08-417

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මීග/ප්‍රා. ලේ./01/11/රා රේන්ද/2022.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රා රේන්ද විකිණීම - 2022 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් තැබෑරුම්වලට 2022 ජනවාරි මස 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2021.09.24 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකය ද, (වත්කම් සහතිකය, ඔබ ඉදිරිපත් කරන ටෙන්ඩර් වටිනාකමින් 15%කට නොඅඩු විය යුතු ය), ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව ඉදිරිපත් කළ යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ ''**අංක .................... දරන ........................ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය**'' යනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2021.09.24 දින පෙරවරු 10.30 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

04. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන **2021.09.24 වැනි දින පෙ. ව. 10.30** ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. අදාළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.11.02 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු ය.

08. ටෙන්ඩරය පිරිනමන ලද තැනැත්තා "තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය. (දුරකතන අංක 031 2224633).

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. යූ. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2021 අගෝස්තු මස 04 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම් අංකය සහ නම* | *තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘතව තැබිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | | අංක 10 - සෙත්තපාඩුව | සෙත්තපාඩුව ගමේ පමණක් | | 5,000 | |
| 02. | | අංක 11 - බසියවත්ත | බසියවත්ත ගමේ පමණක් | | 5,000 | |
| 03. | | අංක 12 - පිටිපන | පිටිපන ගමේ පමණක් | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 5,000 | |
| 04. | | අංක 15 - කුරණ | කුරණ ගමේ පමණක් | | 5,000 | 2021.09.24 පෙ. ව. 10.30 |
| 05. | මීගමුව | අංක 16 - කාමෝච්චෝඩය | කාමෝච්චෝඩය ගමේ පමණක් | | 5,000 | |
| 06. | | අංක 17 - උඩයාර්තෝප්පුව | උඩයාර්තෝප්පුව ගමේ පමණක් | | 5,000 | |
| 07. | | අංක 18 - කුඩාපාඩුව | කුඩාපාඩුව ගමේ පමණක් | | 1,000 | |
| 08. | | අංක 19 - දළුපත | දළුපත ගමේ පමණක් | | 5,000 | |
| 09. | | අංක 20 - පෝරුතොට | පෝරුතොට ගමේ පමණක් | | 3,000 | |
| 10. | | අංක 21 - කොච්චිකඩේ | කොච්චිකඩේ ගමේ පමණක් | | 3,000 | |
| 11. | | අංක 22 - පළඟතුරය | පළඟතුර ගමේ පමණක් | | 1,500 | |

08-375/1

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පන්නිපිටිය, රුක්මලේ අංක 202 බී පදිංචි විතානගේ නිමල් පෙරේරා වන මා විසින් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් අතුල වලිසුන්දර මහතා ලවා 2003.12.14 දින ලියා සහතික කළ අංක 2814 දරන, පන්නිපිටිය රුක්මලේ අංක 202 පදිංචි විතානගේ සුනිල් පෙරේරා යන අයට දුන් ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

විතානගේ නිමල් පෙරේරා.

08-175

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වර්ල්ඩ්වයිඩ් ට්‍රේඩිං ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00211452
සංස්ථාගත කළ දිනය : 2019.05.05
සමාගමේ ලිපිනය : එච්/ජී/එස්/1, මව්ලානාවත්ත නිවාස සංකීර්ණය, කොළඹ 10.

සමාගම් ලේකම්.

08-232

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගෙළිඔය, පෙතියාගොඩ අංක 96A 2 දරන ස්ථානයේ පදිංචි අටුගෙදර සෝරාජපති සිසිර ප්‍රේමලාල් (ජාතික හැඳුනුම්පත් අංකය 683282774 V) වන මා මාස්වෙල, මාවෙල ස්ථානයේ පදිංචි අටුගෙදර සෝරාජපති සුසන්ත ප්‍රේමචන්ද්‍ර (ජාතික හැඳුනුම්පත් අංක 761802801 V) යන අයට ඒ. එම්. එල්. ඩබ්. අත්තනායක 2013.09.04 වැනි දින සහතික කළ අංක 1690 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරමි. බල රහිත කරමි.

මෙම දිනයෙන් පසු එම අටුගෙදර සෝරාජපති සුසන්ත ප්‍රේමචන්ද්‍ර මෙම ඇටෝර්නි බලපත්‍රයට අදළව කරන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ලංකා රජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

අටුගෙදර සෝරාජපති සිසිර ප්‍රේමලාල්.

08-261

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සිවසෝති මුහුන්තන් සහ ජේන් ලීලානි වන අප විසින් ප්‍රදනය කරන ලද ජගනේසන් ඩේමියන් සජේන්ද්‍රන් යන අය වෙනුවෙන් සකස් කරන ලද 2020.10.10 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2021.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලද සහ නිෂ්ප්‍රභා කරන ලද බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ ශ්‍රී ලංකාවාසි මහජනතාවට මෙයින් දැනුම් දෙන අතර මින් ඉදිරියට මෙම ඉහත කී ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන යම් ක්‍රියාවක් හෝ ලියවිල්ලක් සම්බන්ධයෙන් වග නොකියමි.

සිවසෝති මුහුන්තන් සහ ජේන් ලීලානි.

2021 අගෝස්තු මස 01 වැනි දින.

08-277

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ජයසිරි හෝටලය, රන්දියගම මදුරන්කුලිය හි පදිංචි ජා. හැ. අංක (700923797 V) හිමි, නල්ලතම්බි අත්පුද ජයසිරි වන මා විසින් රාජපක්ෂ මුදියන්සේලගේ මන්ගලිකා රාජපක්ෂ ඇටෝර්නි බලකරු ලෙස පත්කරමින් පිළියෙල කළ, පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එම්. ප්‍රසාද් දාබරේ වර්ණකුලසූරිය මහත්මිය විසින් සකස් කළ අංක 1286, 13.11.2015 දිනැති ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2021 ජූලි මස 20 වැනි දින සිට බලපැවැත්වෙන සේ මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරමින් මතු එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිඳු ක්‍රියාවකට මා වග නොකියන බව ද මෙයින් දැනුම් දෙමි.

නල්ල තම්බි අත්පුද ජයසිරි.

08-284

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගල්කිස්ස, ටෙම්ප්ලර්ස් පාර, අංක 170/20 දරන ස්ථානයෙහි පදිංචි වල්ගම්පොලගේ ජූඩ් සුරාජ් පෙරේරා (වි. ග. බ. අං. එන්. 2702338) වන මම ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. රාමරාජා මහතා විසින් ලියා සහතික කළ අංක 2077 සහ වර්ෂ 2011.01.20 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් කෙසෙල්වත්ත, ගොරකාන, නෙළුම් මාවත, විදූසන, අංක 142/12 දරන ස්ථානයෙහි පදිංචි රයිගමගේ සුනිල් ධර්මදාස පෙරේරා (ජා. හැ. අංක 511773687 V) වෙත පවරන ලද බලය වර්ෂ 2021 ක් වූ අගෝස්තු මස 04 වැනි දින සිට අවලංගු කරන ලද බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

වල්ගම්පොලගේ ජූඩ් සුරාජ් පෙරේරා.

08-286

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කොළඹ 13, සෙන් බෙනඩික් මාවත, අංක 86 1/බී දරන ස්ථානයේ පදිංචි ජබස්ටියන් මැරිසන් රුද්‍රිගු (ජා. හැ. අංක 721901017 V) වන මා ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයටත්, එහි ජනතාවටත්, මින් දනුම් දෙන වග නම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් උඩුගම්පොළ බටහිර, කෙහෙල්බද්දර, අංක 18/4 කෝරළගමගේ මන්දිනු පද්මසිරි පෙරේරා යන අය පත් කරමින් දෙන ලද අංක 271 සහ 2016.05.25 වැනි දින දරන ඩී. එල්. ඒ. සුමුදු සන්දරුවන් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍ර පොතේ 118 කාණ්ඩයේ 176 පත්ඉරුවේ දිනපොත් අංක 7635 යටතේ හා 18.06.2016 දතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

ජබස්ටියන් මැරිසන් රුද්‍රිගු.

2021 අගෝස්තු මස 03 වැනි දින.

08-306

---

# රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

මීග/ප්‍රා. ලේ./01/11/වි රේන්ද/2022.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදෙස් මත්පැන් රේන්ද විකිණීම - 2022

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව විදෙස් මත්පැන් විකිණීම සඳහා පහත දක්වෙන උපලේඛනයේ සඳහන් තැබෑරුම්වලට 2022 ජනවාරි මස 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2021.09.24 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකය ද, (වත්කම් සහතිකය ඔබ ඉදිරිපත් කරන ටෙන්ඩර් වටිනාකමින් 15%කට නොඅඩු විය යුතු ය.) ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව ඉදිරිපත් කළ යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ ''අංක ................... දරන ........................ විදෙස් මත්පැන් හල සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2021.09.24 දින පෙරවරු 10.30 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

04. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන **2021.09.24** වැනි දින පෙ. ව. **10.30** ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. අදාළ හා අත්‍යාවශ්‍ය කරුණු සම්පූර්ණකොට නොමැති ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ විදෙස් මත්පැන්හල් නැවත විකිණීම 2021.11.03 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

08. ටෙන්ඩරය පිරිනමන ලද තැනැත්තා "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය. (දුරකතන අංක 031 2224633).

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. යූ. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2021 අගෝස්තු මස 04 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම් අංකය සහ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | මීගමුව | අංක 02 ග්‍රීන් බාර් විදෙස් මත්පැන් හල | අංක 08 කොට්ඨාසයේ කුණ්ඩන්විල පමණක් | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 3,000 | 2021.09.24 පෙ. ව. 10.30 |

08-375/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - කඩුගන්නාව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර කඳුපළාත කෝරළේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුගන්නාව නගර සභා සීමාව තුළ, කඩවත්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කඩවත්ගම ගමේ පිහිටා ඇති තිලිගමුවේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අබේකෝන් මහතා විසින් 2010 මාර්තු මස 10 වැනි දින මැන සාදන ලද අංක 2344 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 27 එහි පිහිටි ගොඩනැගිලි සහ ඊට අයත් සෑම සියලු දේද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 508/235 දරන ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - කඩුගන්නාව නගරයේ සිට නුවර පාරේ පිළිමතලාව දෙසට මීටර් 750ක් පමණ ගමන්කර ධර්මාගාර විහාරය දක්වා පැමිණි විට (101 වන කිලෝමීටර් කණුව පසු කර මීටර් 40ක් පමණ දුරින් සහ කඩුගන්නාව නගර සභා ක්‍රීඩාංගනයට මීටර් කීපයකට කලින්) පාරේ වම්පසින් පාරට මුහුණලා අදාල දේපළ පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ **2021 සැප්තැම්බර් මස 08 වැනි බදාදා දින පෙ. ව. 11.00** ට මහජන බැංකුව කඩුගන්නාව ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID - 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2021.04.23 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත්ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදල සියලුම බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු, මහජන බැංකුව, කඩුගන්නාව වෙත ගෙවිය යුතු වේ. දුරකතන අංක 081 - 2570705.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදළ තොරතුරු ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංකය : 081 - 2227593
දුරකතන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්,
කොළඹ 08
දුරකතන අංක : 011-2671467, 011- 2671468,
දුරකතන/ෆැක්ස් අංකය : 011- 2671469.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-201

**ඩී එෆ් සී සී බැංකුව - පී එල් සී**
(ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 2183/757/146 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ මහනුවර මහ නගර සභා සීමාවට අයත් 236 බහිරවකන්ද ග්‍රාම නිලධාරි වසමේ, බහිරවකන්දේ පිහිටි නික්කමැඩිත්තේහේන ලෙස හැඳින්වෙන (මහනුවර දිසා අධිකරණයේ නඩු අංක 46228 හි ලොට් අංක 4 හි කොටසක්) බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා මොටේ විසින් සාදන ලද 1979 අගෝස්තු මස 26 වැනි දිනැති අංක 2023/ඒ දරන පිඹුරේ ලොට් අංක 4/E 1 ලෙස දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 20.

එහි පිහිටි සියල්ල සහිතව මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. හනීෆා බීබීගේ ඉඩමේ ලකුණු කර ඇති අඩි 4ක් පළල ප්‍රවේශය සමග

ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රී ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. රණතුංග ප්‍රසිද්ධ නොතාරිස් බී. එස්. අබේවික්‍රම විසින් සහතික කරන ලද 2014 ඔක්තෝබර් මස 27, 2014 ඔක්තෝබර් මස 30, 2014 නොවැම්බර් මස 07 දිනැති අංක 2183/757/146 දරන උකස්කරයන් ප්‍රකාර මහනුවර පදිංචි මේරි ඇන් දිලීෂියා වික්‍රමසිංහ සහ පතිරවත්තේ සමන් පතිරණ හෙවත් පතිරණවත්තේ සමන් පතිරණ (මින්මතු බද්ධ ණයගැතියන් ලෙස හැඳින්වෙන) විසින්

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් **2021 සැප්තැම්බර් මස 07 වැනි අඟහරුවාද දින පෙ. ව. 11.00** ට DFCC බැංකුව අංක 5 දේව වීදිය, මහනුවර ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID - 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,

3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදල සියලුම බදු,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න.
දුරකතන අංක : 011 2 371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංකය : 081 - 2227593,
දුරකතන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකතන අංක : 011-2671467, 011- 2671468,
දුරකතන/ෆැක්ස් අංකය : 011- 2671469.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-202

---

## සෙලාන් බැංකුව පීඑල්සී - උඩප්පුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ රාජකඩලුව පදිංචි චන්ද්‍රා මාලිමගේ සුපුන් ලංකා චතුරංග සිල්වා යන අය බන්ධනදයි/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ කටුගම්පොල මැද පත්තු කෝරළේ බටහිර කටුගම්පල හත් පත්තුවේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 1537 නැදලගමුව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නැදලගමුවේ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. වී. ලියනගේ විසින් සාදන ලද 2018.04.11 දිනැති අංක 5549 දරන සැලැස්මේ නිරූපනය වන මීගහහේන, දෙල්ගහවත්ත, අඹගහවත්ත, මීගහකුඹුර, පලුගහහේන්යාය, පරගහමුල පිල්ලෑව සහ අංගම්පිටිය පහළ දෙනිපත් කුඹුර ගොඩකැලේ නමැති ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම එකයි එකක් (අ. 0, රූ. 1, පර්. 32.11) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ **2021 සැප්තැම්බර් මස 07** වැනි දින පස්වරු **2.00** ට සෙලාන් බැංකුව පීඑල්සී උඩප්පුව ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කුලියාපිටිය නගරයේ සිට පන්නල පාර ඔස්සේ කි. මී. 3 ක පමණ දුරක් ගොස් යක්විල වැලිපැන්නමුල හංදිය දක්වා පැමිණ (යක්විල පුස්තකාලය) යක්විල උප නගරය ඔස්සේ වැලිපැන්නමුල කාපර්ට් මාර්ගය දිගේ තවත් කි. මී. 3 ක පමණ දුරක් ගොස් මානවල ආයුර්වේද රෝහල දක්වා පැමිණ රෝහල් මායිමෙන් දකුණු පසට ඇති මාර්ගයට හැරී තවත් මීටර් 100ක් පමණ ඉදිරියට ගිය විට අදළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2021.04.01 වැනි දින පළවී ඇති අතර, ද අයිලන්ඩ්, අරුණ සහ තිනකුරල් යන පුවත්පත්වල 2021.03.16 වැනි දින පළ වී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් - 19 උපදෙස් වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%(සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.* - සහකාර සාමාන්‍යාධිකාරි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක 011- 2456479, 011-2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකතන අංක 011 - 3068185, 011-2572940.

08-265

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**කටාන, මුරුතන, මුරුතන පාරේ වරිපනම් අංක 10/17 දරන පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 10 විශාලැති අගනා බිම් කැබැල්ලක්.**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත් කුරු කෝරළේ, දූණගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 66 දරන ග්‍රාම නිලධාරි වසමේ මුරුතන පිහිටි මුරුතන පාරේ, වරිපනම් අංක 10/17 දරන පරිශ්‍රයේ පිහිටි "Bridgeland Estate" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම්. එච්. ධම්මික බංඩාර විසින් 2017 මැයි මස 31 වැනි දින මැන සකස් කරන ලද අංක 3924 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන ඉඩම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් සී දයාරත්න විසින් පිළිවෙලින් සහතික කරන ලද්දවූ ද, DFCC Bank PLC (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද්දවූ ද, 2017 අගෝස්තු මස 21 වැනි දින සහ 2019 ඔක්තෝබර් මස 24 දිනයන්හි සහතික කරන ලද අංක 12100 සහ 14034 දරන බැඳුම්කරයන් මත අය විය යුතු මුදල ගෙවීමට නේෂන්ස් වික්ටර් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් DFCC Bank PLC බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත පර්චස් 10 (අ. 0, රූ. 0, පර්. 10) 2021 **සැප්තැම්බර් මස 17 වැනි දින පෙ. ව. 11.00 ට** දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණු ලැබේ.

**සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID - 19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති නිර්දේශයන්ට අනනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.**

වැඩිදුර විස්තර සඳහා 2021 ජූනි මස 04 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2021.05.03 වැනි දින ''ද අයිලන්ඩ්'' ''දිවයින'' සහ ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ය විය හැකි මාර්ගය.*- කොළඹ සිට පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ මංසන්ධිය දක්වා ගමන් කර එතැන් සිට ඉදිරියට තවත් මීටර් 750ක් පමණ මහ ඔය පාළම දක්වා ගමන් කර දකුණට හැරී පරණ පුත්තලම පාරේ මීටර් 70ක් පමණ ඉදිරියට ගමන් කර දකුණට පිහිටා ඇති අතුරු පාරේ මීටර් 100ක් පමණ ගමන් කිරීමෙන් අදළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, සහතිකය සඳහා මුද්දර බදු ද වන අතර, ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකාණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් වේනොත් ඒවාද ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.
දුරකතන අංක : 011- 2371371.

පෙර දන්වීමකින් තොරව වෙන්දේසිය අත්හිටුවීමට/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකතන අංක :2873656, 0777 672082, ෆැක්ස් අංකය : 2871184.

02-283

---

**මහජන බැංකුව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන පනතේ 29ඩී (29 D) වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය

**ගොඩනැගිලි සහිත භූමිය ඇතුළු වටිනා වෙළඳ වටිනාකමකින් යුතු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය සහ යාපනය නගර සභා සීමාවේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජේ/79

ග්‍රාම නිලධාරි වසමේ, යාපනේ නගර සභා සීමාවේ, වන්නර්පොන්නායි පත්තුවේ, ගිනිකොන වන්නර්පොන්නායි හි නාවලර් පාරේ පිහිටි ඇස්තමේන්තු අංක 210 දරන මනිකන්තෝට්ටම් නමින් හඳුන්වන භූමිය 2012.05.14 දින බලයලත් මිනින්දෝරු එස්. සුබ්‍රමනියම් විසින් සාදන ලද අංක 1272 බී දරන පිඹුරේ ලොට් අංක 1/1272 බී දරන සහ ලොට් අංක 1/1272සී දරන ඉඩම් කැබලි අයත් ලොට් අංක 1 හි සඳහන්ව ඇති සීමා නිර්ණය කොට බෙදා වෙන් කරන ලද,

නැගෙනහිර දිශාවෙන් : මාර්ගයෙන් ද,
උතුරු දිශාවෙන් : 2009.11.30 දිනැති අංක 1272 පිඹුරේ ලොට් අංක 1න් ද,
බටහිර දිශාවෙන් : මුරුගේසු ආරුමුගම් සහ මුරුගේසු කාසිපිල්ලෙයි ට අයත් දේපළ මගින් ද,
දකුණු දිශාවෙන් : අංක 1272 ඒ පිඹුරේ ලොට් අංක 1 න් ද.

යන මායිම් තුළ පිහිටි 04 Lms V. C & 01K1s ක භූමි ප්‍රමාණය නමුත් 2016.11.25 දින එස්. සුබ්‍රමනියම් විසින් සාදන ලද අංක 1272 C දරන පිඹුරේ ලොට් අංක 1/1272 B සහ ලොට් අංක 1/1272 C හි සඳහන් ව ඇති ඉඩම් කැබලි අයත් 04 Lm V. C & 02.89 K1s ක භූමි ප්‍රමාණයක් වේ. මෙම ප්‍රමාණයෙන් 02 Lms V. C & 08.15 K1s ක ප්‍රමාණයක් 1/1272 බී සඳහන් ව ඇති අතර සහ 2012.05.14 දින එස්. සුබ්‍රමනියම් විසින් සාදන ලද 10 t අංක 1272B දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස සඳහන් ව ඇති 02 Lms V. C & 08.15 K1s ක භූමි ප්‍රමාණයේ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ඇතුළු සියල්ල සමගම වේ.

මහජන බැංකුව විසින් මා හට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් දේපළ **2021 සැප්තැම්බර් මස 23 වන බ්‍රහස්පතින්දා දින පෙරවරු 10.30** ට මහජන බැංකුව අංක 19, ස්ටැන්ලි පාර, යාපනය ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණනු ලබන බව දැනුම් දෙමු.

*දේපළ සඳහා වූ ප්‍රවේශය.* - යාපනය නගරයේ සිට පලෙලි මාර්ගය ඔස්සේ ඉලුපායාඩි හන්දියට පැමිණ එතැන් සිට වම් දිශාවට හැරී නාවලර් මාර්ගයේ මීටර් 150ක් පමණ පැමිණ දුම්රිය හරස් මග පසුකල විට හමුවන හින්දු කෝවිලට ප්‍රථම නැවත වම් දිශාවට හැරී එතැන් සිට ඇති පුද්ගලික මාර්ගයේ පැමිණ ඉහත සඳහන් ඉඩමට ඉතා පහසුවෙන් පිවිසිය හැක. මෙම ඉඩම එම මාර්ගයේ දකුණු දිශාවෙන් මීටර් 30ක් පමණ ඉදිරියෙන් එම මාර්ගයේ ම නැගෙනහිර සීමාවේ පිහිටා ඇත.

*විකිණීමේ නිවේදනය සඳහා.* - කරුණාකර 2020 ජනවාරි මස 08 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් පරිහරණය කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පලාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිල මත වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. විකුණුම් පිරිවැය සහ අනෙකුත් සියලුම ගාස්තු තිබේ නම්,
5. විකුණුම් සහතිකය සඳහා වූ මුද්දර ගාස්තු,
6. මිලදී ගත් මිලෙන් ඉතිරිය 90%ක් වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 82, කන්නතිඩ්ඩි පාර, යාපනය වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත එම මුදල නොගෙවන්නේ නම්, දැනටමත් ගෙවා ඇති මිලදී ගැනීමේ මිලෙන් 10% ක ප්‍රමාණයක් අත්හැර දමා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදළ ලියකියවිලි පහත ලිපිනයෙන් ලබාගත හැකි ය.

ප්‍රාදේශීය කළමනාකරු,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය-යාපනය,
82, කන්නතිඩි පාර, යාපනය.
0212222473

පෙර දැනුම්දීමකින් තොරව වෙන්දේසිය පැවැත්වීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතු ය.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.
දුරකතන අංක 011- 4367467, 011- 4367111.

08-287

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දෙදෙනාම ගුන්නෑපාන පදිංචි අඹන්වල හේරත් මුදියන්සේලාගේ සුනිල් ගාමිණී අඹන්වල සහ ගාර්දිය මානවඩුගේ ෂිරෝමා ප්‍රභාශිනී කුලරත්න යන අය බැඳුම්කරුවන්/උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝදි විසින් දෙකම සහතික කරන ලද 2009 .03.09 දිනැති බැඳුම්කර අංක 2992, 2009.10.29 දිනැති 3125 ප්‍රසිද්ධ නොතාරිස් ජේ. කේ. නවරත්න විසින් සහතික කරන ලද 2011.07.21 දිනැති 832, 2012.07.18 දිනැති 1142, 2013.01.24 දිනැති 1269, 2015.01.19 දිනැති 1615 2016.09.02 දිනැති 1880, 2017.09.07 දිනැති 2032 සියල්ල

2018.09.20 දිනැති 2141, 2142 සහ 2143 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ **2021 ක් වූ සැප්තැම්බර් මස 17 වැනි දින පෙ. ව. 11.00 ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මහනුවර සෙලාන් බැංකුව පීඑල්සී ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කය තුළ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය සහ උඩගම්පහ කෝරළේ පාතදුම්බර බෝගස්කුඹුර 661 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නාපාන පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. එම්. ජී. ඩබ්ලිව්. වයි. වේරපිටිය විසින් සාදන ලද 2009.01.11 දිනැති අංක 905 සැලැස්මේ නිරූපනය වන කයිවදන්තැන්නේහේන නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන ලොට් 1 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් එකොළහයි දශම තුනයි හතරක් (අ. 0, රූ. 03, පර්. 11.34) නොහොත් හෙක්ටයාර් 0.03322ක් විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපලට පිවිසීම.* - මහනුවර සිට මැණික්හින්න (606/625) පාරෙන් කිරිමැටිය හන්දිය දක්වා පැමිණ එතැන් සිට ගුන්නෑපාන පාරෙන් කි. මී. 1ක් පමණ පැමිණි පසු පාරට මුහුණලා වම් පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2021.04.16 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, අයිලන්ඩ් අරුණ සහ තිනකුරල් පුවත්පත්හි 2021.04.20 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන 011 - 2456485, 011- 2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු යි.

චන්ද්‍රිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 09 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.

දුරකථන අංක : 071 4318252, 011 - 2173282.

08-350

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නිට්ටඹුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නිට්ටඹුව ව්‍යාපාර ලියාපදිංචි අංක W/ATH/L/6030 දරන ඇෂ් කෙමි ඉන්ඩස්ට්‍රීස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන නිට්ටඹුව පදිංචි විජේසිංහ මුදලිගේ දොන් අරුණ ශාන්ත යන අය බැඳුම්කරු/ උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ටී. කේ. කළුආරච්චි විසින් සහතික කරන ලද 2014.04.03 දිනැති බැඳුම්කර අංක 878 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් සහතික කරන ලද 2017.08.18 දිනැති 1345 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපල

වර්ෂ **2021 ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දින ප. ව. 1.00 ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව නිට්ටඹුව සෙලාන් බැංකුව පීඑල්සී ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ උඩුගහ පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 343 කළල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළල්පිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. යාපා විසින් සාදන ලද 2005.07.12 දිනැති අංක 964 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත නැමති ඉඩමේ ලොට් සී ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපලට පිවිසීම.* - නිට්ටඹුව නගරයේ සිට කොළඹ - නුවර පාර ඔස්සේ පස්යාල දෙසට 3.00km පමණ දුරින් හමුවන කළල්පිටිය හන්දිය දක්වා පැමිණෙන්න. පසුව දකුණට ඇති දාතුකන්ද පන්සල පාරෙන් මීටර් 700ක් පමණ පැමිණ වම් පසින් ඇති ගම්මැද්ද පාරෙන් මීටර් 500ක් පැමිණි පසු හමුවන "T" හන්දියෙන් දකුණට හැරී මීටර් 50ක් පමණ ගිය පසු දකුණු පසින් වන්නට මෙම විෂයගත දේපළ හමුවේ.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2021.04.16 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ඩේලි මිරර්, අද සහ ටැමිල් මිරර් පුවත්පත් හි 2021.04.19 දින ද, පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන 011 - 2456485, 011- 2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු යි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 09 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක 071 4318252, 011 - 2173282.

08-349

---

**සෙලාන් බැංකුව පීඑල්සී - වෙල්ල වීදිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගල්කිස්ස ලියාපදිංචි W - 201943 යටතේ MYD ඔටෝ ට්‍රේඩිං යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගල්කිස්ස පදිංචි දිනේෂ් සුරංග මල්ලවාරච්චි යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ජී. ජී. සමින්තා විසින් සහතික කරනලද 2015.03.09 දිනැති බැඳුම්කර අංක 564 ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එස්. ද සිල්වා භාරතිරත්න විසින් සහතික කරන ලද 2016.05.05 දිනැති 1687 සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ජී. ජී. සමින්තා විසින් සහතික කරන ලද 2017.05.15 දිනැති 793 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ **2021 ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 11.00** ට සෙලාන් බැංකුව, වෙල්ල වීදිය ශාඛා පරිශ්‍රයේදී සෙලාන් බැංකුව පිඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, දෙහිවල - ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ 19 - වටරප්පල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 19 වටරප්පල තුළ ගල්කිස්ස පිහිටි පොන්සේකා පාර, වරිපනම් අංක 7 සහ 7 1/1 දරන බලයලත් මිනින්දෝරු ජී. ඒ. එස්. එස්. පොන්නම්පෙරුම විසින් සාදන ලද 2016.04.19 දිනැති අංක 670 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 බී 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩබ්ලිව්.

සමරනායක විසින් සාදන ලද 2003.09.20 දිනැති අංක 1965 සැලැස්මේ නිරූපනය වන ලොට් බී 1 හි නැවත මැනීමක් වන) බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) හෙක්ටයාර් 0.0202 විශාල ඉඩම.

*දේපලට පිවිසීම.* - කොළඹ සිට ගාල්ල දෙසට දිවෙන ගාලු පාරෙන් දෙහිවල හන්දිය පසුකර, ගල්කිස්ස දක්වා පැමිණෙන්න, පසුව වමට හැරී Burger Kings අසලින් ඇති පීරිස් මාවතෙන් 200m ක් ගොස් වමට හැරී පොන්සේකා පාරෙන් මීටර් 100ක් ගොස් වංගුව දක්වා පැමිණි පසු වම් පසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දන්වීම.* - 2021.02.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ඩේලි මිරර්, ටැමිල් මිරර් 2020.12.25 දින ද, අද පුවත් පතෙහි 2021.02.11 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන 011 - 2456485, 011- 2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු යි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 09 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.

දුරකථන අංක : 071 4318252.

08-348

**සෙලාන් බැංකුව පීඑල්සී - මොරටුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සියල්ලෝම මොරටුව පදිංචි රඹුක්කනගේ දිශාන්ත ප්‍රනාන්දු, රුවනි සුමුදු කුමාරි කමරාගොඩ සහ කමරාගොඩ මුදියන්සේලාගේ පද්මිනි මල්කාන්ති කමරාගොඩ යන අය බැඳුම්කරුවන්/උකස්කරුවන් වශයෙන් පැහැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් ඩී රංගේ විසින් දෙකම සහතික කරන ලද 2016.01.29 දිනැති බැදුම්කර අංක 1187, 2016.08.22 දිනැති 1312 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ **2021** ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දින පෙ. ව. **10.00** ට සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මොරටුව සෙලාන් බැංකුව පීඑල්සී ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*උපලේඛනය*

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සහ 544 ඒ වතුමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වතුමුල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එල්. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2015.04.23 දිනැති අංක 1348 දරන සැලැස්මේ නිරූපනය වන ගාලුපාර වරිපනම් අංක 571/1 දරන කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් බී 2 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හතයි (අ. 0, රූ. 0, පර්. 7) නොහොත් හෙක්ටයාර් 0.0177ක් විශාල බිම් ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සහ 544 ඒ වතුමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වතුමුල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එල්. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2015.04.23 දිනැති අංක 1348 දරන සැලැස්මේ නිරූපනය වන ගාලුපාර වරිපනම් අංක 571/1 දරන කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් බී 1 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහයි නවයයි (අ. 0, රූ. 0, පර්. 7.59) නොහොත් හෙක්ටයාර් 0.01902ක් විශාල බිම් ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

පහත විස්තර කරනු ලබන අංක 251 සැලැස්මේ නිරූපණය වන ලොට් ඩී උඩින් තුළ හා දිගේ මාර්ග අයිතිය සහ අද ාළ වෙනත් අයිතීන් සමග.

බලයලත් මිනින්දෝරු ජේ. එම්. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1949.06.04 දිනැති අංක 251 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් ඩී (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදාවෙන් කරන ලද ඉඩම් කොටස.

*දේපළට පිවිසීම.* - වරිපනම් අංක 571/1 දරන මෙම දේපළට ගාලු පාර ඔස්සේ රත්මලාන පැබ් රෙස්ටුරන්ට් හි උතුරු මායිමට වන්නට ඇති අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටසින් පැමිණ තවත් මීටර් 50ක් ගිය විට එම පාර කෙලවරට වන්නට දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2021.04.01 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ඩේලි මිරර්, අද, ටැමිල් මිරර් පුවත්පත්හි 2021.03.24 දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පලාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන 011 - 2456485, 011- 2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු යි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 09, අයි - හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක : 071 4318252, 011 - 2173282.

08-351

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සෙන්ට්‍රල් හෝම්ස් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0098 1000 3461

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.10.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් කෝටි හැත්තෑ තුන් ලක්ෂ හත් දහස් තුන්සිය හතලිස් හයයි ශත තුනක (රු. 57,307,346.03) මුදලද, 2018 සැප්තැම්බර් මස 13 වැනි දින සිට අංක 3106, 1843 සහ 3566 දරන බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතක් (17%) හා තවත් රුපියල් හාර කෝටි අසූ ලක්ෂ විසි දහසක (රු. 48,020,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද , දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.01.18 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2019.01.10 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **1 වන උපලේඛනයන්හි දේපළ 2021.09.22 දින පෙ. ව. 11.00 ට හා 2 වන උපලේඛනයන්හි දේපළ 2021.09.22 වැනි දින ප. ව. 12.30 ට ද,** පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ පෙරියමුල්ල අංක 158B ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පෙරියමුල්ල 2 වන කොට්ඨාසයේ හි පිහිටි හලාවත පාර, වරිපනම් අංක 107 දරන "ගොරකාගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ප්‍රසාද් විමලසේන යන අය විසින් සාදන ලද 2016 මාර්තු මස 24 දාතම හා අංක 9939 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : නුවන් ප්‍රසංන,

ටයිටස් අප්පුහාමි සහ මාග්‍රට් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයිති ඉඩම, ගිණිකොණට : හලාවත පාර, නිරිතට : හලාවත පාර, වරිපනම් අංක 105 දරන එම්. කේ. සිවම්, හලාවත පාර, වරිපනම් අංක 97/2 දරන එම්. එස්. මොහොමඩ්, හලාවත පාර, වරිපනම් අංක 97/1 ජී. ජී. ගුණසේන සහ හලාවත පාර, වරිපනම් අංක 97/3 සහ 97/4 ටී. ජේ. රජාබ් සහ ටී. ඒ. රජාබ් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ වයඹට : වාස් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අටයි හතරක් (A:0, R:1, P:18.84) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 9939 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි. :

එකී පෙරියමුල්ල 2 වන කොට්ඨාසයේ හි පිහිටි "ගොරකාගහවත්ත සහ මීගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එල්. කෘෂ් ද පෙරේරා යන අය විසින් සාදන ලද 1962 ජූලි මස 21 දාතම හා අංක 415/1962 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ඊ. ඩබ්ලිව්. ඩී. චාල්ස් අප්පුහාමි යන අයගේ ඉඩම, ගිණිකොනට : හලාවත පාර, නිරිතට : එස්. එල්. ඒ. වහීඩ් යන අයගේ ඉඩම සහ වයඹට : ඩබ්ලිව්. එස්. හර්බට් වාස් සහ බී. පී. පෙරේරා යන අයගේ ඉඩම් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහනමයයි දශම නමයක් (A:0, R:1, P:19.9) විශාල ඉඩම් කොටස සමග වෙළුම/පත්‍රිරුව G 88/110 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 3106 සහ 1843 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ වැලිගම්පිටිය උතුර, අංක 190/A ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ජා-ඇල පිහිටි "කනුවන එස්ටේට්" වර්තමානයේ "ජා-ඇල ඔයිල් මිල්ස් යනුවෙන් හඳුන්වනු ලබන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන එස්. ජී. රණසිංහ යන අය විසින් සාදන ලද 2004 ජූලි මස 20 දාතම හා අංක 1986 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදා වෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 430 දරන පිඹුරේ ලොට් 01, නැගෙනහිරට : මෙහි ලොට් 3, දකුණට : මෙහි ලොට් 12 (මීටර් 11.5ක පළල පාර) සහ බස්නාහිරට : මෙහි ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A:0, R:0, P:7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1986 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J 70/71 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1986 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 12, 13 සහ 14 යනුවෙන් ලකුණු කොට ඇති මාර්ග වෙන් කිරීම් සහ කානු සහ වෙනත් කානු දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

උකස් බැඳුම්කර අංක 3566 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-311

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. ඩී. පී. පෙරේරා සහ කේ. ආර්. ටී. එන්. පෙරේරා.
ගිණුම් අංක : 0021 5004 4785.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිහත් කෝටි අසූ පන්ලක්ෂ පනස්හතර දහස් හයසිය හයයි ශත හැත්තෑ හතරක (රු. 278,554,606.74) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 1211 සහ 1273 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක (රු. 15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක (16.5%) හා තවත් රුපියල් විසිතුන් කෝටි එකොළොස් ලක්ෂ අනූඅට දහස් දොළහයි ශත විසි අටක (රු. 231,198,012.28) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2021.09.10** වැනි දින පෙ. ව. **11.00** ට අනුරාධපුර මෛත්‍රීපාල සේනානායක මාවත, අංක 268, අනුරාධපුර සම්පත්

බැංකු සුපිරි ශාඛා පරිශ්‍රයේ දී, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැන්ද කෝරළේ, මිහින්තලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කුරුන්දකුළම අංක 574 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුරුන්දකුළම ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන එන්. බී. ඒකනායක යන අය විසින් සාදන ලද 2012 මැයි 06 දාතම හා අංක 828 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : ලොට් 34හි ඉඩම, දකුණට : ලොට් 42හි ඉඩම සහ බස්නාහිරට : පාර සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 828 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුව LDO E 12/56 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-313/1

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය.

කේ. ඩී. පී. පෙරේරා, එස්. එම්. පී. රූපසිංහ, ජේ. එම්. ඩී. ටී. ආර්. සෙල්සියා නොහොත් ජේ. එම්. ඩී. ටී. රාණි සහ එන්. ටී. පී. රූපසිංහ නොහොත් එන්. රූපසිංහ.

ගිණුම් අංක : 1021 5478 2002.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ හැටහය දහස් දෙසිය විසි තුනයි ශත හැට පහක (රු. 13,666,223.65) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 401 සහ 968 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂ විසි හතර දහස් තුන්සිය අනූවයි ශත හැට හයක (රු. 5,024,390.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් හතලිස් නම ලක්ෂ හතලිස් නම දහස් හයසිය පනස් හතරයි ශත පනස් හතරක (රු. 4,949,654.54) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) හා තවත් රුපියල් විසිහය ලක්ෂ අනූපන් දහස් නමසිය අනූ අටයි ශත තිස් තුනක (රු. 2,695,998.33) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2021.09.09** වැනි දින **පෙ. ව. 11.00** ට කොළඹ පාර, තෙල්වත්ත හන්දිය, අංක 203 ඩී, සම්පත් බැංකු මීගමු ශාඛා පරිශ්‍රයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඒත්තුකාල් අංක 73 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඒත්තුකාල් ග්‍රාමයේ පිහිටි ''දවටගහවත්ත, බදුල්ලගහකුඹුර නොහොත් කිරිල්ලගහකුඹුර, කහගහ වත්ත, කසතමරත්තඩිතෝට්ටම් සහ පුන්නමරතඩිතෝතටම් '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ජී. ඩයස් යන අය විසින් සාදන ලද 2007 මැයි 28 දාතම හා අංක 4017A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ඇළ නමුත් ටෝ පාත් ( Tow Path) (වඩා නිවැරදිව), දකුණට : අංක 4017A දරන එකී පිඹුරේ ලොට් 1B සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4017 A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුව G 128/106 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-313/2

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. ඩී. පී. පෙරේරා සහ ආර්. ටී. ඩබ්ලිව්. ජේ. එම්. ආර්. එන්. පී. එල්. බී. ඩී. විජයරත්න.

ගිණුම් අංක : 0021 5004 4866.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් නමකෝටි හැත්තෑ හත් ලක්ෂ අසූ දහස් විසි දෙකයි ශත අටක (රු. 97,780,022.08) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 3100 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම කෝටි දෙලක්ෂ පනස් තුන්දහස් නමසිය අසූ හතරයි ශත විසි තුනක (රු. 90,253,984.23) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2021.09.10 වැනි දින** පෙ. ව. 11.30 ට අනුරාධපුර, මෛත්‍රීපාල සේනානායක මාවත, අංක 268, අනුරාධපුර සම්පත් බැංකු සුපිරි ශාඛා පරිශ්‍රයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

උතුරු මැද පළාතේ. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, උතුරු කනාදර කෝරළේ (සුළු කොට්ඨාසය) නුවරගම් පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ අනුරාධපුර මහ නගර සභා සීමාවන් තුළ 01 අදියර අංක 249 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අනුරාධපුරය පිහිටි ''ඇළබොඩ කැළේ'' යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද පත්‍රිරු අංක 81 (අතිරේක අංක 01) හි අංක 02 දරන අවසන් නාගරික සැළසුමේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 342 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FVP 523 හි ලොට් 341 සහ 61, නැගෙනහිරට : FVP 523 හි ලොට් 61 සහ ලොට් 1071 සහ 818, දකුණට : ලොට් 818, 837 සහ 343 හා බස්නාහිරට : ලොට් 837, 343 සහ 341 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි නමයයි හතරයි එකක් (හෙක්ටෙයාර් 0.3941) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක අ. 02 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D26/105 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-313/3

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කඩවත ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

මෙම දේපළ කඩවත සිය ලියාපදිංචි කර්යාලය පිහිටා ඇති සහ ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් 30113 දරන පයිස් ෆැබ් එන්ටර්ප්‍රයිසර්ස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කඩවත පදිංචි මීගමු ආරච්චිගේ සරත් අමරසිරි යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

*1 වන වෙන්දේසිය :*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ 286 ඒ, ගෝනහේන බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගෝනහේන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් සාදන ලද 2000.11.15 දිනැති අංක 19/2000 දරන සැලැස්මේ නිරූපනය වන ගෝනහේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 19/2000 දරන සැලැස්ම අනුව පර්චස් විසිහතක් (අ. 0, රූ. 0, පර්. 27) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පහත විස්තර කරනු ලබන පරිදි මාර්ග ප්‍රවේශය සමඟ, පෙර කී ගෝනහේන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන විසින් සාදන ලද 1992.02.21 දිනැති අංක 535 දරන සැලැස්මේ නිරූපනය වන ගෝනහේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටස එකී අංක 535 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම පහයි බිංදුවක් (අ.0, රූ. 0, පර්. 8.50) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

පෙර කී ගෝනහේන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන විසින් සාදන ලද 1992.06.02 දිනැති අංක 535ඒ දරන සැලැස්මේ නිරූපනය වන ගෝනහේන එස්ටේට් නමැති ඉඩමේ

ලොට් 13 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කොටස එකී අංක 535 ඒ දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.90) විශාල එහි සඳහන් වෙනත් සියලු දේ සමඟ ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සහතික කරන ලද 2002 පෙබරවාරි මස 12 දිනැති උකස් බැඳුම්කර අංක 352 සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජයවික්‍රම විසින් සහතික කරන ලද 2007 මාර්තු මස 26 දිනැති අංක 3210 යටතේ උකස් කරන ලද දේපළකි.

ඉහත සඳහන් දේපළ **2021 සැප්තැම්බර් මස 03 වැනි දින පෙරවරු 11.00 ට** සෙලාන් බැංකුව පීඑල්සී කඩවත ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කොළඹ- මහනුවර මාර්ගය ඔස්සේ කඩවත නගරය පසුකර ගොස් රන්මුතුගල මංසන්ධිය දක්වා පැමිණ මාවරමංඩිය දෙසට දිවෙන ගෝනහේන පාරට හැරෙන්න. එම ගෝනහේන මාර්ගය දිගේ තවත් කි. මී. 2.6 ක පමණ දුරක් ගිය විට ඇති ජයකොඩි ලී මෝල ඉදිරිපිටින් දකුණු පසට පිහිටි අඩි 20 ක් පළල ඇති මාර්ගයට හැරී මීටර් 50 ක් පමණ ඉදිරියට ගිය විට ඇති "Y" හංදියෙන් දකුණු පසට ඇති මාර්ගයට හැරී තවත් මීටර් 75 ක පමණ දුරක් ගිය විට විශාල කර්මාන්තශාලාවක් ද සහිත අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය .-*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරිමේ, කොට්ඨාසය තුළ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ 286 ඒ, ගෝනහේන බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගෝනහේන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. යූ. ඩී. රණසිංහ විසින් සාදන ලද 2012.02.01 දිනැති අංක 1848 දරන සැලැස්මේ නිරූපනය වන ගෝනහේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කර ලද ඉඩම් කොටස එකී අංක 1848 දරන සැලැස්ම අනුව පර්චස් දහනවයක් (අ. 0, රූ. 0, පර්. 19) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ඉඩම පහත විස්තර කරනු ලබන ලොට් 25 ලොට් 24 හි කොටසක් සමඟ එකතු කිරීමක් වේ. පෙර කී ගෝනහේන පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන විසින් සාදන ලද 1992.02.05 දිනැති අංක 528 ඒ දරන සැලැස්මේ නිරූපනය වන ගෝනහේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 25 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 528 ඒ සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0 පර්. 13.5) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

පෙර කී ගෝනහේන පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන විසින් සාදන ලද 1992.02.05 දිනැති අංක 528 ඒ දරන සැලැස්මේ නිරූපනය වන ගෝනහේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 24 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම කොටස එකී අංක 528 ඒ දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 13.5) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණරත්න විසින් සාදන ලද 1992.02.05 දිනැති අංක 528 ඒ දරන සැලැස්මේ නිරූපණය වන ලොට් 19 (පාර සඳහා වෙන් කිරීම) තුළ උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශය සමඟ.

ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජයවික්‍රම විසින් සහතික කරන ලද 2012 මාර්තු 23 දිනැති උකස් බැඳුම්කර අංක 4581 යටතේ උකස් කරන ලද දේපළකි.

ඉහත සඳහන් දේපළ **2021 සැප්තැම්බර් මස 03 වැනි දින පෙරවරු 11.15 ට** සෙලාන් බැංකුව පීඑල්සී කඩවත ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කඩවත ශ්‍රමදාන මාවත ඔස්සේ කි. මී. 1.5 ක පමණ දුරක් ගොස් කෙසෙල්වත්ත නාමපුවරුව දක්වා පැමිණ දකුණු පසට ඇති ප්‍රාදේශීය සභා පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 200 ක පමණ දුරක් ගොස් වම්පසින් පිහිටි 16 වන පටුමඟට හැරී තවත් මීටර් 75 ක පමණ දුරක් ගිය විට නිවාස අංක 456/2/1 දරන අදාල දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීතිරීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.-* රජයේ ගැසට් පත්‍රයේ 2021.04.01 වැනි දින පළ වී ඇති අතර, ද අයිලන්ඩ්, අරුණ සහ තිනකුරල් යන පුවත්පත්වල 2021.03.17 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.* සහකාර සාමාන්‍යාධිකාරී නීති, සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දු.ක. 011-2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දූ.ක. 011-3068185, 011-2572940

08-235

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පන්නල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල දෙදෙනාම පන්නල පදිංචි කොඩිකාර ආරච්චිලාගේ චන්ද්‍ර ස්වර්ණසිරි කොඩිකාර සහ මුණසිංහ මුදියන්සේලාගේ අංජලිකා උදයාංගනී මුණසිංහ යන අය බන්ධනදායි/උකස්කරුවන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ, කටුගම්පල හත්පත්තුවේ මැදපත්තු කෝරළේ බටහිර පහළ ගලයාය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, ගලයාය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද 2012.02.14 දිනැති අංක 10845 දරන සැලැස්මේ නිරූපණය වන අළුත්තේමුල්ලේ කුඹුර දූන් වත්ත නමැති බෙදා වෙන් කරනලද ඉඩම් කොටස, එකී අංක 10845 දරන සැලැස්ම අනුව පර්චස් හයක් (අ.0, රූ. 0, පර්. 06) විශාල ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලුදේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපල **2021 සැප්තැම්බර් මස 07 වන දින පෙරවරු 10.00** ට සෙලාන් බැංකුව පීඑල්සී පන්නල ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-* පන්නල නගරයේ සිට කුරුණෑගල - මීගමුව ප්‍රධාන මාර්ගයේ මීටර් 250 ක පමණ දුරක් ගිය විට අංජලී හාඩ්වෙයාර් නමැති නාමපුවරුව ඉදිරිපස සවිකර ඇති අදාළ දේපල මාර්ගයේ වම් පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.-* රජයේ ගැසට් පත්‍රයේ 2021.04.01 වන දින පළ වී ඇති අතර ද අයිලන්ඩ්, අරුණ සහ තිනකුරල් යන පුවත්පත්වල 2021.03.15 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහිතක කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු. තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :- සහකාර සාමාන්‍යාධිකාරි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දූ.ක. 011-2456479, 2456481

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3 විහාර මාවත, කොලොන්නාව,
දූ.ක. 011-3068185, 011-2572940

08-236

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පිටකොටුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල ජා-ඇල පදිංචි වැවලගමගේ දෙන් අසේල ජයන්ත යන අය බන්ධනදායි/උකස්කරුවන් වශයෙන් සෙලාන් බැංකුව

පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ බටුවත්ත උප කාර්යාලය තුළ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ 211 බටගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බටගම උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඒ. ගුණවර්ධන විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 24 දිනැති අංක 1790 දරන සැලැස්මේ නිරූපණය වන පාසල් මාවත, වරිපනම් අංක 22/1 දරන ඇටඹගහලන්ද හෙවත් තල්ගහවත්ත නමැති දැන් එක ඉඩමක් ලෙස සෑදුනු ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. පී. පෙරේරා විසින් දෙකම සාදන ලද 1990.08.02 දිනැති අංක 11572 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් බී 1 සහ 2001.01.07 දිනැති අංක 17238 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් බී 2 සී හි පවත්නා මායිම් අනුව එකතු කිරීමක් සහ නැවත මැනීමක් වන) බෙද වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 17.7) විශාල ඉඩම.

බලයලත් මිනින්දෝරු එස්. ඒ. ගුණවර්ධන විසින් සාදන ලද 2015.09.24 දිනැති අංක 1790 දරන සැලැස්මේ වන එකී ලොට් බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් දෙකම සාදන ලද 1990.08.02 දිනැති අංක 11572 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් බී 1 ලකුණු කළ ඉඩමේ සහ 2001.01.07 දිනැති අංක 17238 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් බී 2 සී ලකුණු කළ ඉඩමේ එකතු කිරීමක් වේ.

බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1990.08.02 දිනැති අංක 11572 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් බී 3 සහ බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 2001 ජනවාරි මස 07 දිනැති අංක 17238 දරන සැලැස්මේ සඳහන් ලොට් බී 2 ඒ හි එකතු කිරීමක් මගින් සෑදුණු බලයලත් මිනින්දෝරු එස්. ඒ. ගුණවර්ධන විසින් සාදන ලද 2015.09.24 දිනැති අංක 1790 දරන සැලැස්ම අනුව අඩි 12ක් පළල පාර උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් ද සමග.

ඉහත සඳහන් දේපළ **2021 සැප්තැම්බර් මස 03 වැනි දින පෙරවරු 9.30** ට සෙලාන් බැංකුව පීඑල්සී පිටකොටුව ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ පුත්තලම ප්‍රධාන මාර්ගය ඔස්සේ රිලවුල්ල මංසන්ධිය දක්වා පැමිණ දකුණු පසට ඇති බටගම පල්ලිය පාරට හැරී තවත් කි. මී. 1.4ක පමණ දුරක් ගිය විට (බටගම ශාන්ත අන්තෝනි පල්ලිය පසු කළ විගස) වම්පසට ඇති බටගම පාසල් මාවතට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 150 ක පමණ දුරක් ගොස් බටගම පාසල් ක්‍රීඩා පිටිය දක්වා පැමිණි විට දකුණු පසට ඇති අඩි 12ක් පළල ඇති අතුරු මාර්ගයට හැරී මඳ දුරක් ගිය විට අදළ දේපළ මාර්ගය අවසානයේ මාර්ගයට යාබදව පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- රජයේ ගැසට් පත්‍රයේ 2021.04.16 වැනි දින පළ වී ඇති අතර ඩේලි මිරර්, අද සහ ටමිල් මිරර් යන පුවත්පත්වල 2021.04.20 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහිතක කිරීම සඳහා රු. 3000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වේතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :- සහකාර සාමාන්‍යාධිකාරි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456479, 2456481

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3 විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940

08-264

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.